# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2233/27 - 2021 ජුනි මස 23 වැනි බදාදා - 2021.06.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 07**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2013 නොවැම්බර් මස 11 වැනි දිනැති අංක 1836/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්.ඒ.බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 ජුනි මස 23 වැනි දින.

**I කොටස**

| | | |
|---|---|---|
| සංශෝධන අංක 01 | - | 2014 නොවැම්බර් මස 05 වැනි දින හා අංක 1887/21 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 02 | - | 2015 මාර්තු මස 09 වැනි දින හා අංක 1905/7 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 03 | - | 2017 පෙබරවාරි මස 17 වැනි දින හා අංක 2006/53 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 04 | - | 2017 දෙසැම්බර් මස 12 වැනි දින හා අංක 2049/14 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 05 | - | 2019 අගෝස්තු මස 28 වැනි දින හා අංක 2138/27 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 06 | - | 2020 අගෝස්තු මස 25 වැනි දින හා අංක 2190/26 *අති විශෙෂ ගැසට් පත්‍රය* |


1A - G 34476 — 25 (2021/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II** කොටස

7.1 III ශ්‍රේණියට බඳවා ගන්නා අනුපාතය

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| 1. විවෘත බඳවා ගැනීම - (අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලත් ඉංජිනේරුවරුන් සඳහා පමණි) | සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75% |
| 2. සීමිත බඳවා ගැනීම | සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% |

7.1.1 ඉවත් කරනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 විවෘත බඳවා ගැනීම සඳහා අදාළ විෂය ධාරාවන් යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලත් ඉංජිනේරුවරුන් පමණක් බඳවාගනු ලැබේ.

7.2.3.2 වෘත්තීය සුදුසුකම්

(i) 2017 අංක 04 දරන පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ, අදාළ සේවා කාණ්ඩය යටතේ ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු හෝ වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම.

7.2.3.3 වෙනත්

(vi) ඉහත 7.2.3.3 (i) සිට 7.2.3.3 (v) දක්වා සුදුසකම් සම්පූර්ණ කරනු ලැබ තිබෙන්නා වූත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබෙන්නා වූත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති නිලධාරියකු වීම.

7.2.4 වයස

7.2.4.2 ඉහත 7.2.3.3 (vi) යටතේ සුදුසුකම් ලබන රජයේ නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 45 වනු ඇත.

7.2.5 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.5.1 දීප ව්‍යාප්ත සේවාවන්වලට හා රජයේ සේවයේ විධායක නිලධර ගණයේ තනතුරු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ පොදු තරඟ විභාගයේ පළමු කොටසේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. බඳවා ගැනීමේ තරඟ විභාගය සම්බන්ධ කරුණු උපලේඛන II හි දැක්වේ.

7.2.5.2.1 ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් ප්‍රශ්න පත්‍ර දෙකටම ලබා ඇති මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවාගනු ලැබේ. එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1.1 කොන්දේසි සහ නියමයන්

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

7.3.1.2 සුදුසුකම්

සුදුසුකම් සපුරා තිබිය යුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් දිනට පහත (i), (ii), (iii), (iv) හා (v) වගන්ති යටතේ සඳහන් සුදුසුකම්වලින් එකක් සමඟ 2017 අංක 04 දරන පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සංස්ථාගත ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

(iv) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 21 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම.

(v) (අ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියකු ලෙස වසර 15 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, එම කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති බඳවා ගනු ලබන විෂය ධාරාව යටතේ වසර 04ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර උපාධියක් ලබා තිබීම.

(vi) ඉවත් කරනු ලැබේ.

10.1.1.1

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.2.1

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.3.1.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

උපලේඛන II

පවතින උපලේඛන II වෙනුවට පහත උපලේඛන II ආදේශ කරනු ලැබේ.

**විවෘත ධාරාව යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තුන්වැනි (III) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගය**

දීප ව්‍යාප්ත සේවාවන්වලට හා රජයේ සේවයේ විධායක නිලධර ගණයේ තනතුරු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ පොදු තරඟ විභාගයේ පළමු කොටස මේ සඳහා අදාළ වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

01. විභාග පරිපාටිය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 1/2 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. | 40 |
| අවබෝධය | පැය 02 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. | 40 |

02. විෂය නිර්දේශය

*බුද්ධි පරීක්ෂණය*

අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටළු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම හා උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ.

*අවබෝධය*

අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.

03. විභාග මාධ්‍යය

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.
II. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.
III. අපේක්ෂකයින් මෙම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතුය.
IV. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

07 - 52

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.